(6)

00065

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2018

ESC2316/EPA2816 - පෙරපාසල් ඉගෙනුම්-ඉගැන්වීම් පිළිබඳ ක්‍රම සහ කළමනාකරණය

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2018.12.29 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. පෙරපාසලක කළමනාකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

02. පෙරපාසල් දරුවන්ගේ මූලික අවශ්‍යතා පහක් (05) ලියන්න.

03. පෙරපාසලක වාර්තා පවත්වාගෙන යාමෙන් ලබාගත හැකි ප්‍රයෝජන පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

04. මූල්‍ය සම්පත් යනු මොනවා ද?

05. පහත දැක්වෙන දේ පිළිබඳව පෙරපාසලක තිබිය යුතු අවම අවශ්‍යතා කෙටියෙන් පැහැදිලි කරන්න.

    (i) ලී බඩු සහ උපකරණ

    (ii) පෙරපාසල් ගුරුවරයාගේ සුදුසුකම්

06. පෙරපාසලක තක්සේරුකරණය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

07. ශ්‍රී ලංකාවේ පෙරපාසල් අධ්‍යාපනයේ අභිමතාර්ථ තුනක් (03) සඳහන් කරන්න.

08. පෙරපාසලක ක්‍රියාකාරකම් සඳහා දරුවන් කණ්ඩායම් කිරීම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) පෙරපාසලක පන්ති කාමර කළමනාකරණය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 08)

(ii) පන්තිකාමර කළමනාකරණය පෙරපාසල් ගුරුවරයාට වැදගත්වන ආකාරය උදාහරණ දෙකක් **(02)** ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

10. (i) පෙරපාසලක නිර්මාණාත්මක ඉගෙනුම් පරිසරයක් සඳහා අවධානය යොමු කිරීමට හේතු සාධක මොනවා ද? (ලකුණු 08)

(ii) පෙරපාසලක භෞතික පරිසරය විදහා දැක්වෙන රූප සටහනක් අඳින්න. (ලකුණු 12)

11. (i) පෙරපාසල් අධ්‍යාපනය හා සම්බන්ධ දෙමාපිය භූමිකාවේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසලක දෛනික ක්‍රියාකාරකම් සඳහා දෙමාපියන් පෙරපාසල් ගුරුවරයාට උදව් ලබාදිය හැක්කේ කෙසේ ද යන්න උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) පෙරපාසල් ගුරුවරයෙකුට පෙරපාසල් දරුවන් සමග ක්ෂේත්‍ර චාරිකාවක් යාම සඳහා සැලැස්මක් ඇත. පෙරපාසල් කළමනාකරුවකු ලෙස පෙරපාසල් ගුරුවරයා මෙය සංවිධානය කරන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් දරුවන් සඳහා මෙවැනි ක්‍රම භාවිත කිරීම තුළින් ලබාගත හැකි වාසි පහක් **(05)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) පෙරපාසලක තක්සේරුකරණ උපකරණ ලෙස භාවිත කරන උපකරණ මොනවාද? (ලකුණු 08)

(ii) පෙරපාසලක තක්සේරු කරණ වාර්තාවල වැදගත්කම උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.